# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

## 2. ත්‍රිරෝද රථ භාවිතය

කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් වර්තමාන තත්වය යටතේ, ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි ත්‍රිරෝද රථ වල ගමන් කරන මගීන්ගේ සංඛ්‍යාව අවම කළ යුතු අතර අනෙකුත් ආරක්ෂක පියවරයන් අනුගමනය කළ යුතුය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**ත්‍රිරෝද රථ රියදුරන්**

- උපරිම මගීන් සංඛ්‍යාව දෙකකට සීමා කර ඇති බවට සහතික විය යුතුය.
- රිය පැදවීම සහ මගී ආසන අතර විනිවිද පෙනෙන ආවරණයක් සවි කරන්න.
- මුදල් හැසිරවීම අවම කිරීම සහ ගාස්තු සඳහා නිශ්චිත මුදල ගෙන ඒමට මගීන් දිරිමත් කිරීම.
- සෑම විටම ඔබ සමඟ ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරකයක් තබා ගන්න.
- හැකි නම් මගීන් සඳහා ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරකයක් සපයන්න.
- වාහනයේ නිතර ස්පර්ශ වන පෘෂ්ටයන් යන් පිරිසිදු කර විෂබීජහරණය කරන්න (අවම වශයෙන් සෑම ධාවන වාර 5 ක් අවසානයේම).
- සියලුම මගීන් මුහුණු ආවරණ පැළඳ සිටින බවට සහතික විය යුතුය.
- ත්‍රිරෝද රථයට ඇතුළුවීමට පෙර සියලුම මගීන් ඇල්කොහොල් අඩංගු දෑත් පිරිසිදුකාරක යොදා ගනිමින් අත් පිරිසිදු කර ගත යුතුය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකඟතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම අයිතිකරු/ රියදුරු ගේ වගකීම වේ.

**මගීන්**

- මුහුණු ආවරණයක් නිසි ලෙස පැළඳිය යුතුය.
- කුලී රථ ධාවනය අතරතුර ජංගම දුරකථනය ස්පර්ශ නොකිරීමට උත්සාහ කරන්න.
- නිතර ස්පර්ශ වන පෘෂ්ටයන් අනවශ්‍ය ලෙස ස්පර්ශ නොකරන්න.
- සංචාරය අතරතුරදී මුහුණ ස්පර්ශ නොකරන්න. ත්‍රිරෝද රථයක ගමන් කිරීමෙන් පසු අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් හා ජලය සමග අත් සේදීම කල යුතුය.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- ජනමාධ්‍ය භාවිතයෙන් දැනුම් දීම.
- නියමිත උපදෙස් ත්‍රිරෝද රථය තුළ ප්‍රදර්ශනය කිරීම.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.